# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2408/06 - 2024 ඔක්තෝබර් මස 28 වැනි සඳුදා - 2024.10.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**සංගණන ආඥාපනත (143 අධිකාරය)**

2 වැනි වගන්තිය යටතේ පැනවෙන නියෝග

අනුර කුමාර දිසානායක වන මම මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා වශයෙන් සංගණන ආඥාපනතේ (143 අධිකාරය) 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජන හා නිවාස සංගණනය - 2024 ට අදාළ තුන්වන අදියර වන පුද්ගලයින්ගේ හා නිවාසවල තොරතුරු රැස් කිරීම 2024 වර්ෂයේ අවසාන භාගය තුළ දී පැවැත්විය යුතු යැයි නියෝග කරමි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ,
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ දී ය.

EOG 10 - 0240/1

---

සංගණන ආඥාපනත

සංගණන ආඥාපනතේ (143 අධිකාරයේ) 5 වැනි වගන්තිය යටතේ මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යවරයා විසින් පනවන ලද ව්‍යවස්ථා.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන,
සැලසුම් සහ සංචාරක අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ,
මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### ව්‍යවස්ථා

### *I කොටස - ප්‍රාරම්භය*

1. මෙම ව්‍යවස්ථා 2024 ජන හා නිවාස සංගණන ව්‍යවස්ථා යනුවෙන් දක්වනු ලැබේ.

2. මෙම ව්‍යවස්ථා සම්බන්ධයෙන් අන්‍ය අර්ථකථනයක් අවශ්‍ය වුවහොත් විනා ‘ආඥාපනත’ සංගණන ආඥාපනත (143 අධිකාරය) ද, ‘අධිකාරි’ යනුවෙන් සංගණන අධිකාරිවරයා ද, ‘කොමසාරිස්’ යනුවෙන් සංගණන කොමසාරිස්වරයා ද, ‘නියෝජ්‍ය කොමසාරිස්’ යනුවෙන් නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරයා ද ‘සහකාර කොමසාරිස්’ යනුවෙන් සහකාර සංගණන කොමසාරිස්වරයා ද (සංගණන අධිකාරි හා සංගණන කොමසාරිස්වරුන්, 2022 ජනවාරි මස 25 වැනි දින, අංක 2264/8 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත.) ඊට අමතර වශයෙන් සංගණන කටයුතු සඳහා සම්බන්ධ වන නිලධාරීන් ‘සංගණන නිලධාරි’ ලෙස ද අදහස් කෙරේ.

### *II කොටස - සාමාන්‍ය*

1. ජන හා නිවාස සංගණනය - 2024 හි ගණන් ගැනීමේ අදියරේ කටයුතු පහත සඳහන් පරිදි පැවැත්විය යුතු වේ.

| | *ක්‍රියාවලිය* | *කාලවකවානුව* |
|---|---|---|
| (i) | ටැබ්ලට් පරිගණක මගින් හෝ “ඇන්ඩ්‍රොයිඩ්” ජංගම උපාංග භාවිතයෙන් හෝ වෙබ් ෆෝරමයක් මගින්, සාමාන්‍යය පදිංචි ස්ථානය අනුව පුද්ගලයින්ගේ තොරතුරු රැස් කිරීම සහ නිවාස පිළිබඳ තොරතුරු රැස් කිරීම | 2024 ඔක්තෝබර් - 2024 දෙසැම්බර් |
| (ii) | සංගණන දිනය | 2024 දෙසැම්බර් 19 |
| (iii) | සංශෝධන වටය<br><br>සංගණන දිනය හා සංගණන මොහොත පදනම් කරගෙන සාමාන්‍යය පදිංචි පුද්ගලයින්ගේ තොරතුරු සංශෝධනය කරමින් ගණන් ගැනීම | 2024 දෙසැම්බර් 19 - 2024 දෙසැම්බර් 23 |

2. සෑම පුද්ගලයෙකුම, ගණන් ගැනීමේ අදියරට අදාළ තොරතුරු, ඒ සඳහා අධිකාරි හෝ කොමසාරිස් විසින් අදාළ ප්‍රදේශයට පත් කරනු ලබන සංගණන නිලධාරීන්ට සැපයිය යුතුය.

3. අධිකාරි හෝ කොමසාරිස් විසින් පත් කරනු ලබන අධීක්ෂණ නිලධාරීන් විසින්, ගණන් ගැනීමේ අදියරට අදාළ උපාංගවල ඇතුළත් කරන ලද තොරතුරුවල තත්ත්වය පිළිබඳව පරීක්ෂා කළ යුතුය.

*III කොටස - සංගණන නිලධාරීන්ගේ රාජකාරි කටයුතු*

1. ආඥාපනතින් හෝ ඒ යටතේ පනවන ලද යම්කිසි ව්‍යවස්ථාවකින් අධිකාරිවරයා වෙත පවරන ලද හෝ ප්‍රදානය කරන ලද ඕනෑම බලයක් හෝ රාජකාරියක් අධිකාරි පොදු හෝ විශේෂ විධානය පරිදි, නියෝජ්‍ය සංගණන අධිකාරිවරයෙක් විසින් දිවයින තුළ ද, ප්‍රදේශය භාර නියෝජ්‍ය / සහකාර සංගණන අධිකාරිවරයෙක් විසින් එම නියෝජ්‍ය / සහකාර සංගණන අධිකාරිවරයාට නියමිත ප්‍රදේශය තුළ ද ක්‍රියාවේ යෙදවීම හෝ ඉටු කිරීම කළ හැකිය.

2. ආඥාපනතින් හෝ ඒ යටතේ පනවන ලද යම්කිසි ව්‍යවස්ථාවකින් කොමසාරිස්වරයෙකු වෙත පවරන ලද හෝ ප්‍රදානය කරන ලද ඕනෑම බලයක් හෝ රාජකාරියක් එම ප්‍රදේශයේ කොමසාරිස්වරයාගේ පොදු හෝ විශේෂ විධානය පරිදි, තමා පත් වී සිටින ප්‍රදේශ සීමාව තුළ ක්‍රියාවෙහි යෙදවීම හෝ ඉටු කිරීම නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරයෙකු විසින් කළ හැකිය.

3. සෑම සංගණන නිලධාරියෙක්ම, අධිකාරි හෝ තමා සංගණන නිලධාරියෙකු වශයෙන් පත් වී ඇති කොට්ඨාසය භාර කොමසාරිස් හෝ නියෝජ්‍ය / සහකාර කොමසාරිස් විසින් නියම කරන ලද දිනවල දී, නියම කරන ලද ස්ථානවල දී හා වේලාවන් හි දී පුහුණු පන්තිවලට හා පරීක්ෂා කිරීම්වලට සහභාගී විය යුතුය.

4. ගණන් ගැනීමේ කාර්යය සඳහා යොදවන ලද සංගණන නිලධාරියෙකු විසින් සාමාන්‍යයෙන් එම සේවය සම්බන්ධයෙන් හැරුණු විට, උපලේඛනයක් සම්පූර්ණ කිරීම සඳහා තමන් විසින් ලබා ගන්නා ලද කිසියම් තොරතුරක් නීත්‍යානුකූල බලයක් නොමැතිව ප්‍රසිද්ධ කිරීම හෝ අන් කිසිවෙකුට දැනුම් දීම හෝ නොකළ යුතුය.

5. ගණන් ගැනීමේ කාර්යය සඳහා යොදවන ලද සංගණන නිලධාරියෙකු විසින් ගණන් ගැනීමට අදාළ ටැබ්ලට් පරිගණක හෝ ජංගම උපාංග හෝ ආකෘතිපත්‍ර හෝ වෙනත් ලියකියවිලි තුළ ඇති තොරතුරු, තමන්ගේ භාරයේ තිබෙන තෙක් නීත්‍යානුකූල බලයක් නොමැති කිසිවෙකුට ඒවා නොපෙන්විය යුතුය.

6. කිසියම් සංගණන කාර්යයක් සඳහා යොදවන ලද සංගණන නිලධාරියෙකු විසින් තමා සේවයට පත් වූ අවස්ථාවේ දී පහත දැක්වෙන දිවුරුම හෙවත් සහතික ප්‍රකාශය සම්පූර්ණ කොට අත්සන් කළ යුතුය.

....................................................................... වන මම .................................................... වශයෙන් මගේ යුතුකම් සංගණන ආඥාපනතේ නියමයන්ට හා ඒ යටතේ පනවා ඇති නීතිවලට එකඟව, විශ්වාසවන්තව හා අවංකව ඉෂ්ට කරන බවත්, එමෙන්ම සංගණන නිලධාරියෙකු වශයෙන් සේවය කිරීමේ දී මට ලබා ගත හැකි වන කවර නමුත් තොරතුරක් ඒ සඳහා නියමිත බලයක් නොලැබ ප්‍රසිද්ධ කිරීම හෝ එළිදරව් කිරීම නොකරන බවත්, විධිමත්ම, අවංකව හා සැබෑ වශයෙන් ද මෙයින් ප්‍රකාශ කරමි.

.............................................
අත්සන

මා ඉදිරිපිට දීය.

ස්ථානය : ...................................................
දිනය : .......................................................

.............................................
අත්සන හා නිලය

7. අධීක්ෂණ නිලධාරියෙකුගේ ධූරයට පහත් නොවූ, ධූරයක් දරන සෑම සංගණන නිලධාරියෙකුටම පූර්වෝක්ත ව්‍යවස්ථාව යටතේ සඳහන් දිවුරුම හෝ සහතික ප්‍රකාශය අන් සංගණන නිලධාරියෙකුගෙන් ලබා ගැනීමට හැකිය.

***IV* කොටස - සංගණන කටයුතු සඳහා ලබා ගත යුතු තොරතුරු**

1. සංගණන කටයුතු සඳහා සංගණන උපලේඛනවලින් ලබා ගත යුතු තොරතුරු පහත සඳහන් වේ.

**අ . ජන හා නිවාස උපලේඛනය**

**(i) පුද්ගලයින් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු :**

නම : ..........................................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය : .........................................................

ගෘහ මූලිකයාට ඇති නෑකම / සම්බන්ධතාවය : .........................................................

පූජ්‍ය / පූජක තත්ත්වය : .........................................................

ස්ත්‍රී පුරුෂ භාවය : .........................................................

උපන් වර්ෂය හා මාසය : .......................................................

උපත ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කර තිබේද යන බව : .........................................................

විවාහක තත්ත්වය : .........................................................

ආගම : .........................................................

ජන වර්ගය : .................................................

පුරවැසිභාවය :.................................................

ඔබ උපදින විට ඔබගේ මව සාමාන්‍ය පදිංචි දිස්ත්‍රික්කය / රට : .................................................

සාමාන්‍ය පදිංචි දිස්ත්‍රික්කයේ දැනට පදිංචිව සිටින කාලය (අවුරුදු වලින්) : ......................................

මීට පෙර (අවසන් වරට) සාමාන්‍ය පදිංචිව සිටි දිස්ත්‍රික්කය / රට : ................................................

දැනට පදිංචි දිස්ත්‍රික්කයට පදිංචියට ඒමට හේතුව :.................................................

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : .................................................

ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .................................................

බෝ නොවන රෝග තත්ත්වයන් : .................................................

පසුගිය දින 30 තුළ නිරත වූ අධ්‍යාපන කටයුත්ත : .................................................

ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම : .................................................

ස්මාර්ට් (සුහුරු) ජංගම දුරකථනය හෝ ටැබ්ලට් පරිගණකය භාවිතා කර කිසියම් කාර්යයක් තනිවම සිදුකළ හැකි ද යන්න : .................................................

පරිගණකය භාවිතා කර කිසියම් කාර්යයක් තනිවම සිදුකළ හැකිද යන්න : ..................................

ශාරීරික සහ මානසික අපහසුතා : .................................................

භාෂාවන් කතා කිරීමේ හැකියාව : .................................................

භාෂාවන් කියවීමේ හා ලිවීමේ හැකියාව : .................................................

වෘත්තීය පුහුණුවක් හෝ සුදුසුකමක් ලබා තිබේ ද යන්න (සහතිකයක් සහිතව) : ............................

පසුගිය සතිය තුළ අඩුම වශයෙන් පැයක් හෝ කිසියම් ආර්ථික කටයුත්තක් සිදු කළා ද යන්න : .....
.........................................................................................

පසුගිය සතිය තුළ දී යෙදුණු ප්‍රධාන රැකියාව (සිදු කළ ආර්ථික කටයුත්ත) : ..................................
.........................................................................................

රැකියාව අයත් වන කාණ්ඩය : .................................................................................

ආයතනයේ නම : ..........................................................................................

ඔබ සේවය කරන ආයතනයේ හෝ ඔබගේ ආයතනයේ සිදු කරන ප්‍රධාන ආර්ථික කටයුත්ත : ........

..........................................................................................

ඔබ සේවය කරන ආයතනයේ හෝ ඔබගේ ආයතනයේ සිදු කරන ආර්ථික කටයුත්තේ ස්වභාවය :

..........................................................................................

ඔබ රැකියාව හෝ ආර්ථික කටයුත්ත සිදු කරන දිස්ත්‍රික්කය : ..........................................

පසුගිය සතිය තුළදී ඔබ ආර්ථික කටයුත්තක් සිදු කළේ නැති නමුත් ඔබ වැටුප් ලබන රැකියාවක් කිරීමට හෝ ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවක් තිබේද යන්න : .......................

..........................................................

පසුගිය සති 4 තුළ ඔබ වැටුප් ලබන රැකියාවක් කිරීමට හෝ ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට යම් පියවරක් ගත්තේද යන්න : ..........................................................................................

ඉදිරි සති දෙක තුළ රැකියා අවස්ථාවක් ලැබුණොත් ඔබ එය භාර ගැනීමට සූදානම් ද / ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට සූදානම් ද යන්න : ..................................................................

ඔබ රැකියාවක් භාර ගැනීමට / ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට බලාපොරොත්තුවක් / සූදානමක් නොමැති වීමට ප්‍රධාන හේතුව :............................................................

කවදා හෝ සජීවී දරු උපතක් සිදු වූවාද යන්න :..........................................................

මුළු සජීවී දරු උපත් ගණන : .................................................................

දැනට ජීවත්ව සිටින මුළු දරුවන් ගණන : ..........................................................

අවසාන සජීවී දරු උපත සිදු වූ වර්ෂය හා මාසය : ................................................................

**(ii) ගෘහ කාණ්ඩයට අයත් නමුත් මෙරට වෙනත් ස්ථානයක සාමාන්‍ය පදිංචිය ඇති පුද්ගලයින් සඳහා (ස්ථිර පදිංචිය සඳහා හැර)**

නම : .................................................................................................................................

ගෘහ මූලිකට ඇති නෑකම : .........................................................

ස්ත්‍රී පුරුෂ භාවය : .........................................................

පසුගිය උපන් දිනයට වයස අවුරුදු වලින් : .......................................................

දැනට පදිංචි දිස්ත්‍රික්කයේ නම හා කේතය : .........................................................

වෙනත් ස්ථානයක පදිංචි වීමට ප්‍රධාන හේතුව : .........................................................

**(iii) ගෘහ කාණ්ඩයට අයත් නමුත් මාස 6 කට වැඩි කාලයක් විදේශගත වී හෝ මාස 6කට වැඩි කාලයක් විදේශගත වී සිටීමට අදහස් කරමින් විදේශගත වූ පුද්ගලයින් සඳහා (ස්ථිර පදිංචිය සඳහා හැර)**

නම : .................................................................................................................................

ගෘහ මූලිකට ඇති නෑකම : .........................................................

ස්ත්‍රී පුරුෂ භාවය : .........................................................

පසුගිය උපන් දිනයට වයස අවුරුදු වලින් : ................................................................

දැනට පදිංචි රටේ නම හා කේතය : .............................................................

විදේශගත වීමට ප්‍රධාන හේතුව : .............................................

විදේශගත වූ කාලය : .............................................

**(iv)** ගෘහ කාණ්ඩ තොරතුරු

ගෘහ කාණ්ඩයේ සාමාන්‍ය පදිංචි පුද්ගලයින් ගණන : .........................................

බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන මාර්ගය / ප්‍රභවය : .........................................................

ඔබගේ ගෘහ කාණ්ඩයට බීමට අවශ්‍ය ජල පහසුකම ඔබගේ නිවස තුළටම ලබා ගෙන තිබේ ද යන්න:

.................................................

බීමට ජලය ලබා ගන්නා ප්‍රධාන ප්‍රභවය මගින් වර්ෂය පුරා ජලය ලබා ගැනීමට ඇති හැකියාව :

.............................................................

පසුගිය වර්ෂය (2023) තුළ බීමට ජලය ලබා ගැනීමට නොහැකි වූ මාස : .......................................

ආහාර පිසීමට ගන්නා ප්‍රධාන බලශක්තිය / ඉන්ධන වර්ගය : ..........................................

ආහාර පිසීමට ගන්නා ද්විතීය බලශක්තිය / ඉන්ධන වර්ගය : ..........................................

ආලෝකය ලබා ගන්නා ප්‍රධාන ප්‍රභවය : ..........................................

ආලෝකය ලබා ගන්නා ද්විතීය ප්‍රභවය : ..........................................

වැසිකිළි පහසුකම් : ..........................................

වැසිකිළියේ ස්වභාවය : ..........................................

ඝන අපද්‍රව්‍ය බැහැර කරන ප්‍රධාන මාර්ගය : ..........................................

ද්‍රව අපද්‍රව්‍ය බැහැර කිරීම : ..........................................

නිවසේ භුක්තිය : ..........................................

පවත්නා සන්නිවේදන තාක්ෂණ උපකරණ, පහසුකම් (දැනට භාවිතයේ පවතින) සහ ගෘහ කාණ්ඩයේ ප්‍රයෝජනය සඳහා වන වාහන : ...............................................

2023 වසරේදී මෙම ගෘහ කාණ්ඩයේ පදිංචි කිසියම් සාමාජිකයෙකු මිය ගියා ද යන්න : .................

.......................................

මිය ගිය සංඛ්‍යාව : ...........................

එම මරණවලින් ලියාපදිංචි කළ සංඛ්‍යාව : ................................

**(v)** නිවාස ඒකක තොරතුරු

නිවාස ඒකකය සාමාන්‍ය නිවාස ඒකකයක් ද නැතහොත් එකිනෙකට නෑකමක් නොදක්වන පුද්ගලයින් පදිංචි වමරියක් / බෝඩිමක් ද යන්න : ..........................................

නිවාස ඒකකයේ ව්‍යුහය : ..........................................

සාදා නිම කළ වර්ෂය : ........................

ඉදිකිරීම් සඳහා යොදා ඇති ප්‍රධාන ද්‍රව්‍ය : ..........................................

නිවාස ඒකකයම තනි කාමරයක් ද ඒකකයේ කාමර ගණන එකකට වඩා වැඩි ද යන්න :

.................................................................

නිදන කාමර ගණන : ....................................

නිවාස ඒකකයට අයත් මුළු කාමර ගණන : .....................................

ආ. ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කර ඇත් ද කොටසක් සම්පූර්ණ කර ඇත් ද යන්න : ........................................

2. සංගණන නිලධාරියෙකුට තමාගේ ප්‍රදේශය තුළ සිටින සියලුම පුද්ගලයින්ගෙන් ඔවුන් පිළිබඳව හෝ ඔවුන්ගේ ගෘහ කාණ්ඩවල පදිංචි අයවලුන් පිළිබඳව මෙම කොටසේ I වන ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණුවලට අදාළ ප්‍රශ්න විචාරීමෙන් හෝ එවැනි පුද්ගලයින් ලවා නියමිත ආකෘති පත්‍රවල අවශ්‍ය කරුණු ඇතුළත් කිරීමට සැලැස්වීමෙන්, සංගණන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත හැක.

3. ජන හා නිවාස උපලේඛනය, විශේෂ ආයතන සඳහා වන උපලේඛනය හා හිසට වහලක් නොමැති පුද්ගලයින් පිළිබඳ උපලේඛනය නිවැරදි ලෙස සම්පූර්ණ කර ඇති බව නිශ්චය කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රශ්න ඕනෑම පුද්ගලයෙකුගෙන් ඇසීමට සංගණන නිලධාරියෙකුට පිළිවන.

4. සාමාන්‍යයෙන් පදිංචි ස්ථානය අනුව පුද්ගලයින් පිළිබඳව හා නිවාස පිළිබඳව ලබා ගන්නා ලද තොරතුරු, අධිකාරි සුදුසු යැයි නියම කරන ඕනෑම අවස්ථාවක ඕනෑම පුද්ගලයෙකුගෙන් නැවත විමසා දැන ගැනීමට සංගණන නිලධාරියෙකුට පිළිවන.

5. මෙම කොටසේ I වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු කිසියම් පුද්ගලයෙකු වෙනුවෙන් සංගණනයේ දී වාර්තාගත වී තිබේදැයි සෑහීමකට පත්වනු පිණිස, මෙම කොටසේ I වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන කරුණු සියල්ලම හෝ කිහිපයක් වාර්තාගත කිරීම පිණිස අවශ්‍ය ඔහුගේ නම සහ සාමාන්‍යයෙන් ඔහු පදිංචිව සිටින ස්ථානය පිළිබඳ ප්‍රශ්න ඇසීමට සංගණන නිලධාරියෙකුට හැකි වන අතර එම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම එකී පුද්ගලයාගේ යුතුකම වන්නේය.

6. ආඥාපනතේ හෝ ඒ යටතේ පනවා ඇති ව්‍යවස්ථාවක විධිවිධානයන් යටතේ උපලේඛනයක් සම්පූර්ණ කළ යුතු සෑම පුද්ගලයෙකු විසින්ම, එම උපලේඛනයෙහි හෝ වෙනත් උපලේඛනයක නම සඳහන් වී තිබෙන කිසියම් පුද්ගලයකු වෙනුවෙන් ඔහු විසින් ඇතුලත් කරන ලද කරුණු, අවශ්‍ය නම් සංශෝධන වටයේ දී සංශෝධනය කිරීම සහ මෙම කොටසේ I වැනි ව්‍යවස්ථාව යටතේ දැක්වෙන දැනට ඇතුලත් කර නොමැති, යම් යම් කරුණු ඇතුළත් කිරීම ද කළ හැකි වන්නේය.

EOG 10 - 0240/2